ජනවාර්ගික සංහිඳියාව සහ රාජ්‍යය ගොඩනැඟීම හා සම්බන්ධ කතිකාව තුළ මේ ප්‍රශ්නය සංවාදයට බඳුන්විය යුතු බව අපගේ අදහසයි. ශ්‍රී ලංකා රාජ්‍යය ගොඩනැඟීම හා සම්බන්ධ කතිකාවේ එක් පැතිකඩක් වන්නේ මෙයයි.

රාජ්‍යය ගොඩනැඟීම හා සම්බන්ධ කතිකාවේ

*<u>ශ්‍රී ලංකා රාජ්‍යය ප්‍රතිසංවිධානය කළ යුතුය යන අදහස අදත් පවතින අතර රාජ්‍යය පිළිබඳ අතෘප්තියෙන් පසුවන පිරිසක් ද සිටිති. එහෙත් ඒ අතෘප්තියෙන් පසුවන පිරිස උතුරු නැගෙනහිර දෙමළ ජනතාව පමණක් නොවේ. අපි මෙය පටු කොට දැක්වීමට පුරුදු වී ඇත්තෙමු.</u>*

අනෙක් පැතිකඩ වන්නේ ආර්ථික අර්බුදයයි. ආර්ථික අර්බුදය පිළිබඳ ගැටලුව ප්‍රථමයෙන් පැනනගින්නේ ශ්‍රී ලංකාවේ දකුණු පළාත කේන්ද්‍ර කර ගෙනයි. (එහෙත් මෙය දකුණු පළාතට පමණක් සීමා වූ ගැටලුවක් තරමට ලඝු කොට නොසැලකිය යුතුය. ශ්‍රී ලංකාවේ සමස්ත ජනතාවට බලපාන ගැටලුවකි) 1971 වර්ෂයේ දී එහි පළමු පුපුරායාම සිදු වූ අතර 1980 දශකයේ අගභාගයේ දී එහි දෙවන පුපුරායාම ද සිදු විය. ජනතා විමුක්ති පෙරමුණ මේ සඳහා නායකත්වය දෙනු ලැබීය. විරැකියාව, දරිද්‍රතාවය හා බැඳුණු ගැටලු රාශියක් එම පුපුරායාම් මඟින් ප්‍රකාශ විණ. මෙම ආර්ථික සාධකය අමතක කොට අපට රාජ්‍යය ගොඩනැඟීමේ සුබ සිහිනය සැබෑ කරගත නොහැකි වනු ඇත.

**උතුරත් දකුණත් එක්ව විසඳුමක් සෙවිය යුතුයි**

ශ්‍රී ලංකා රාජ්‍යය ප්‍රතිසංවිධානය කළ යුතුය යන අදහස අදත් පවතින අතර රාජ්‍යය පිළිබඳ අතෘප්තියෙන් පසුවන පිරිසක් ද සිටිති. එහෙත් ඒ අතෘප්තියෙන් පසුවන පිරිස උතුරු නැගෙනහිර දෙමළ ජනතාව පමණක් නොවේ. අපි මෙය පටු කොට දැක්වීමට පුරුදු වී ඇත්තෙමු. පවතින දේශපාලන, අර්ථ ක්‍රමය ගැන අතෘප්තියෙන් පසුවන විශාල පිරිසක් උතුරේ මෙන්ම දකුණේ ද ජීවත් වෙති. තවත් පිරිසක් කඳුකර ප්‍රදේශ ආශ්‍රිතව ජීවත් වෙති. රාජ්‍යය ප්‍රතිසංවිධානය කිරීමේ කතිකාව තුළ අප ඒ පිරිස නොසලකා හැර ඇත.

වාර්ගික, ආගමික භේදයකින් තොරව රටේ බහුතර පිරිසක් අද පවතින මේ දේශපාලන, අර්ථ ක්‍රමය ගැන අතෘප්තියෙන් පසුවෙති. විරැකියාව, අධ්‍යාපනය, සෞඛ්‍යය, නිවාස ආදී ක්ෂේත්‍ර හා බැඳුණු ගැටලු රාශියකින් උතුරේ දෙමළ ජනතාවත් දකුණේ සිංහල ජනතාවත් වෙලී ජීවත් වෙති. රාජ්‍ය සේවය තුළ, ආණ්ඩුකරණය තුළ පුරවැසියනට හිමිවිය යුතු සම අවස්ථා ඇහිරී ඇත. එහෙත් අප මේ පොදු සාධකය අමතක කොට දමා ඇත. ශ්‍රී ලංකා රාජ්‍යය ගොඩනැඟීමේ කතිකාව තුළ මෙම පොදු සාධකය ආමන්ත්‍රණය විය යුතුව ඇත.

එක් පැත්තකින් සිංහල, දෙමළ ජනතාවගේ සමාජ, ආර්ථික දුක්ගැනවිලිවලට සංවේදී වන අතරම අනෙක් පැත්තෙන් මේ සියලූ ජන කොටස්වලට සමානත්වයෙන් සහ ගෞරවයෙන් ජීවත්විය හැකි බහුත්වවාදී සංස්කෘතියක් (සමාජ ක්‍රමයක්) ගොඩනැඟීම අරමුණු කරගන්නා තැනෙකට මෙම කතිකාව පරිවර්තනය විය යුතුය. සාමය හා සංහිඳියාව ඇති කිරීමත් ආර්ථික දුක්ගැනවිලිවලට පිළියම් යෙදීමත් එකම කාසියේ දෙපැත්ත මෙන් එකිනෙක හා බැඳි පවතින්නක් බව අපගේ වැටහීමයි.

මේ අනුව ශ්‍රී ලංකා රාජ්‍යය ගොඩනැඟීමේ ව්‍යාපෘතිය තුළ ජනවාර්ගික සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමේ වැඩපිළිවෙලක් ද, ආර්ථික වෘද්ධි ඉලක්ක ළඟා කරගැනීමේ සැලසුමක් ද ඇතුළත් විය යුතුව ඇත. හුදෙක් මෙම කාරණා දෙක එකවර ආමන්ත්‍රණය වන ආකාරයේ පුළුල් සමාජ කතිකාවක් ගොඩනැඟිය යුතුව තිබේ. මන්දයත්, උතරත් දකුණත් යා වන තැනෙක විසඳුම් ලක්ෂ්‍යය පිහිටා ඇති බැවිනි.

සංජීව මුණසිංහ


# LANKAN AUTO CARE

**Licensed Roadworthy Tester (R.W.C)**



ALL MECHANICAL REPAIRS
LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS
AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES
FUEL INJECTION | COMPUTER DIAGNOSTIC




Ranjith Perera
Mob: 0409 866 886

**9798 2200**

**14/30 Tower Court**
**Noble Park 3174**

# Tomorrows Migration Solutions Today...

**FAIRFIELDS**
IMMIGRATION LAWYERS - MELBOURNE

LAW INSTITUTE OF VICTORIA SPECIALIST ACCREDITATION

Our team of Specialist Lawyers, Lawyers & Barristers in Melbourne competently assisted many Sri Lankans, many other nationalities and many Australian Companies in the following areas of Migration matters over the years and continue to do so:

- General Skill Migration Permanent Resident visas
- General Skill Migration Provisional Resident visas
- Second stage Skilled Regional (Permanent residence) visas
- Graduate Skill Temporary visas
- Complex Student visas
- 457 Visas
- Employer Nominations (ENS)
- Employer Contracts
- Negotiations of employer nominations with the Australian Employers
- Regional Sponsored Migration Scheme (RSMS)
- Skill Assessments
- State Sponsorships
- TRA cancellations
- Criminal Prosecutions on TRA cancellations
- Student Visa Cancellations
- Permanent residence Cancelations
- Appeals to the Migration Review Tribunal (MRT) or Administrative Tribunal (AAT)
- Business Migration State Sponsorships
- First and Second Stage Business Migration visas
- Spouse & visas
- Aged Parent visas
- Aged Dependent Parent visas
- Contributory Parent visas
- Resident Return visas
- Australian Citizenships

***Our Team of Lawyers:***

**Don Susantha Katugampala** LL B (Monash)
MARN: 9601070
Accredited Immigration Law Specialist
Principal Lawyer – Fairfields Lawyers

**Michael Gros** LL B (Monash)
MARN: 9803398
Consulting Barrister

**Frank Sabelberg** LL B (Monash)
MARN: 0004726
Consulting Solicitor

**FAIRFIELDS**
IMMIGRATION LAWYERS - MELBOURNE

10 Morrison Place East Melbourne VIC 3002
T | 03 9650 4557 F | 03 9650 4559
info@fairfieldslawyers@com.au

***We Deliver Results...***